ආදරණීය ශිෂ්‍යයනි,

උපකුලපතිතුමාගේ පණිවිඩය

ඔබ දන්නා පරිදි, 2019 අප්‍රේල් 21 පාස්කු ඉරිදා දින සිදුවූ ඛේදජනක සිදුවීම් හේතුවෙන් විශ්වවිද්‍යාලයීය අධ්‍යයන කටයුතු සති කිහිපයකට තාවකාලිකව අත්හිටුවීමට අපට සිදුවිය. අධ්‍යයන කටයුතු නැවත ආරම්භ කර හැකි ඉක්මනින් යථා තත්වයට පත් කිරීමට අපි සූදානමින් සිටින්නෙමු.

ඔබ නැවත විශ්වවිද්‍යාලයට පැමිණෙන විට, විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ නව ආරක්ෂක ක්‍රියාමාර්ග ආරම්භ කර ඇති බව ඔබට දැකගත හැකිවනු ඇත. ජාතික ආරක්ෂාව සැලකිල්ලට ගෙන සුදුසු නිර්ණායකයන්ට අනුව ජනාධිපති ලේකම්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජාතික ආරක්ෂක ආයතනයෙන් ලැබී ඇති උපදෙස් පරිදි අප එසේ සිදු කර ඇත. සමස්ත විශ්වවිද්‍යාල ප්‍රජාවෙහිම ආරක්ෂාව හා සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා අප විසින් මෙම පියවර ගෙන ඇති බව කරුණාවෙන් සලකන්න. අවශ්‍ය පරිදි මෙම තත්වය අප විසින් සමාලෝචනය කරන අතර මෙම පියවර බොහෝමයක් තාවකාලික වන බවට අපි බලාපොරොත්තු වන්නෙමු. මෙම අභියෝගාත්මක අවස්ථාවෙහි අපගේ රට උදෙසා මේ සම්බන්ධයෙන් අප සමඟ සහයෝගයෙන් කටයුතු කරන මෙන් ඉල්ලා සිටින්නෙමු.

විශ්වවිද්‍යාලයට නැවත පැමිණීම සම්බන්ධයෙන් බොහෝ දෙනෙකුට බියක් ඇති බව මම අවබෝධ කරගෙන සිටින්නෙමි. බොහෝ දේවල් වෙනස් වී ඇති බව සහ ඔබට කිසිවෙක් විශ්වාස කළ නොහැකි බව හෝ අප එකිනෙකාට කෙරෙහි බියෙන් හෝ සැකයෙන් සැලකිය යුතු බව ඔබට හැඟෙනු ඇත. මෙය අප විසින් මෙතෙක් අත්විඳින ලද භයානක සිදුවීම් සම්බන්ධයෙන් සාමාන්‍ය ප්‍රතික්‍රියාවක් විය හැකි වුවද, එම බිය හේතුවෙන් අප විසින් එකිනෙකා කෙරෙහි සලකන ආකාරයට බලපෑම් කිරීමට ඉඩ දිය නොහැක. අපේ රටේ අති මහත් බහුතරයක් ජනතාව සාමයට ආදරය කරන ඉවසිලිමත් ජනතාවක් වේ. අන්තවාදීන් කිහිප දෙනෙකුට අපව වෙනස් ලෙස සිතීමට පෙළඹවීමට ඉඩ නොදිය යුතුය.

දිවයිනේ අනෙකුත් විශ්වවිද්‍යාල මෙන්ම ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය ද බහු වාර්ගික, බහු ආගමික ප්‍රජාවක් සහිත විශ්වවිද්‍යාලයක් බවට මම සිහිපත් කිරීමට කැමැත්තෙමි. මෙය අපගේ විශාලතම ශක්තිය බවට මම විශ්වාස කරමි. අපගේ භාෂාව, චාරිත්‍ර, ආහාරපාන හෝ ඇඳුම් පැළඳුම් වලින්ද එක් එක් සංස්කෘතිය හා ප්‍රජාව අපගේ අනන්‍යතාවය කෙරෙහි අද්විතීය හා විශේෂ යමක් දායක කරනු ලබයි. මෙය අපට සැබැවින්ම ආඩම්බර විය හැකි කාරණාවකි.

මේ මොහොතේ, බිය සහ සැකය අප වටා පවතින විට, එකිනෙකා අතර අපගේ සම්බන්ධතාවයන් ශක්තිමත් කරගත යුතු අතර ඒ සඳහා එකිනෙකා කෙරෙහි ඇති අවබෝධය තවදුරටත් පවත්වාගෙන යාමට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය තුළ පවතින විවිධත්වයෙන් උපරිම ප්‍රයෝජන ගත යුතු වේ. විවිධත්වය අගය කළ

යුත්තේ කෙසේද සහ එයට අපව භේද කිරීමට ඉඩ දෙනවාට වඩා එමගින් ශක්තිමත් වන්නේ කෙසේද යන්න පිළිබඳ මුළු රටටම ආදර්ශයක් සැපයීමට අපට හැකි වනු ඇත.

ඔබ මීට පෙර සිදුකළ ආකාරයටත් වඩා මිත්‍රත්වයෙන් එකිනෙකා වෙත සමීප වන මෙන් ආයාචනා කරමි. ඔබ මෙන් නොවන අයට සමීප වන අතර ඔබට වඩා වෙනස් අය පිළිබඳ අවබෝධය වර්ධනය කරගන්නා මෙන් මම ඔබගෙන් විශේෂයෙන් ඉල්ලමි. එක්සත් වූ ජාතියක් ලෙස සුවපත් කිරීමට සහ ඉදිරියට ගමන් කිරීමට මෙය උපකාරී වනු ඇත.

පාස්කු ඉරිදා සිදු වූ ඛේදජනක සිදුවීම් වලින් අනතුරුව, ත්‍රස්තවාදීන්ට අප කවුරුන්දැයි නිර්වචනය කිරීමට සහ භේද කිරීමට ඉඩ ලබා නොදීමේ වැදගත්කම බොහෝ ශ්‍රී ලාංකිකයින් ප්‍රකාශ කරන ලදි. මෙම රට තුළ අසීරු කාල පරිච්ඡේදයන් අප ගත කර ඇති අතර නැවත එම අඳුරු කාල පරිච්ඡේදය කරා ආපසු යැමට අප කිසිවෙකුට අවශ්‍ය නොමැත. විශ්වවිද්‍යාල ප්‍රජාවේ කිසිවෙකු කොන් වීම, ඉවත් කිරීම හෝ වෙනස්කම් කිරීමකට ලක් නොවීම තහවුරු කිරීම මෙසේ ඉදිරියට ගමන් කිරීමේදී ගත හැකි ඉතා වැදගත් පියවරක් වේ. මෙම ඛේදජනක සිදුවීම් වලින් යථා තත්වයට පත් වීමට හැකි උපරිම ලෙස කටයුතු කිරීමේදී එකිනෙකා වෙනුවෙන් උදව් කිරීමට හා සහාය දැක්වීමට ඔබට කළ හැකි සියළු දේ සිදු කරන මෙන් ආයාචනා කරමි. අපව භේද කිරීමට, නොඉවසීම හා අසමගිය වර්ධනය කිරීමට උත්සාහ කරන බලවේග බොහොමයක් පවතින බැවින් මෙය එතරම් පහසු නොවනු ඇත. මෙම ගැටළු වලින් කිහිපයක් පිළිබඳ සාකච්ඡා කිරීම, දැනුවත් කිරීම හා සංවාදයන් සඳහා පහසුකම් සැලසීමට විශ්වවිද්‍යාලය පියවර ගනු ඇත. විශ්වවිද්‍යාලය තුළ සියළුම ජන කොටස් අතර සම්බන්ධතාවයන් ශක්තිමත් කළ හැකි ක්‍රියාකාරකම් හා සංවාද ආරම්භ කිරීමට අප විසින් ශිෂ්‍ය ප්‍රජාව ධෛර්යමත් කරන්නෙමු. ගරුත්වයෙන් හා අවබෝධයෙන් එකිනෙකා ආරක්ෂා කිරීමට හා රැකබලා ගැනීමට සැම විටම සුපරික්ෂාකාරිව සිටින ලෙස අප ඔබෙන් ඉල්ලා සිටින්නෙමු. නැවත වරක්, විශ්වවිද්‍යාලයේ කිසිවෙකු තර්ජනයකට, වෙනස්කම් කිරීමකට හෝ කොන් කිරීමකට ලක් නොවීමට වග බලා ගන්නා මෙන් ආයාචනා කරමි. කරුණාකර මේ සම්බන්ධයෙන් ඔබට ගැටළුවක් තිබේ නම් වහාම අදාල බලධාරීන් සමඟ සාකච්ඡා කරන්න.

ඔබට යම් ගැටළුවක් තිබේ නම් හෝ තවදුරටත් මේ පිළිබඳ සාකච්ඡා කිරීමට කැමතිනම් හෝ කිසියම් ගැටළුවක් සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන්නේ නම්, පීඨ සාමාජිකයින්ට, ශිෂ්‍ය උපදේශකයින්ට හෝ අපගේ උපදේශන ඒකකය සමඟ කතා කිරීමට අප ඔබව දිරිමත් කරන්නෙමු.

සමස්ත විශ්වවිද්‍යාල ප්‍රජාවෙහිම ආරක්ෂාව හා සුරක්ෂිතතාව තහවුරු කිරීමට අප විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පහත දැක්වේ. මෙම ක්‍රියාමාර්ග විශ්වවිද්‍යාලයීය මධ්‍යම මණ්ඩපය සහ ප්‍රාදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථාන සඳහා අදාළ වේ. මෙම ක්‍රියාමාර්ග බොහොමයක් විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලයට, ශිෂ්‍යයින්ට, සහ අමුත්තන්ට අදාළ වේ.

- සියළුම ශිෂ්‍යයන් සෑම විටම විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ ශිෂ්‍ය වාර්තා පොත සමග ජාතික හැඳුනුම්පත (NIC) රැගෙන යා යුතු වේ.
- විශ්වවිද්‍යාලයට ඇතුල් වීමේදී සහ විශ්වවිද්‍යාලයේ ඕනෑම නිලධාරියෙකුගේ ඉල්ලීම මත විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළදී ශිෂ්‍ය වාර්තා පොත සමග ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු වේ.
- පදිකයන් සඳහා පිවිසුම් දොරටු අංක 1, 3 සහ 4 පමණක් භාවිතා කළ යුතු වේ.
- රථ වාහන සඳහා පිවිසුම් දොරටු අංක 3 සහ 4 පමණක් භාවිතා කළ යුතු වේ.
- පිවිසුම් දොරටු අංක 2 නැවත දැනුම් දෙන තුරු වසා තබනු ලැබේ.
- විශ්වවිද්‍යාලයට ඇතුල් වන සියළුම රථ වාහන පිවිසුම් දොරටුවලදී ආරක්ෂක අංශ විසින් පරීක්ෂා කරනු ලැබේ.
- විශ්වවිද්‍යාලයට ඇතුල් වන සියළුම පුද්ගලයන්ගේ ගමන් මළු පිවිසුම් දොරටුවලදී ආරක්ෂක නිලධාරීන් විසින් පරීක්ෂා කරනු ලැබේ.
- පුද්ගලයන්ගේ අනන්‍යතාවය හඳුනාගැනීම වළක්වන සියළුම වර්ගයේ සම්පූර්ණ මුහුණු ආවරණ විශ්වවිද්‍යාලය තුළට ඇතුල්වීමේදී හෝ විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ භාවිතා කිරීම සඳහා අවසර නොමැත.
- පස්වරු 8.30 වනවිට විශ්වවිද්‍යාල පිවිසුම් දොරටු වසා දැමේ. සියළුම දෙනා පස්වරු 8.30 වන විට විශ්වවිද්‍යාල පරිශ්‍රයෙන් ඉවත් විය යුතු වේ.
- විශ්වවිද්‍යාලය විසින් අමතර ආරක්ෂක ක්‍රියාමාර්ග ස්ථාපනය කිරීම සඳහා ලද උපදෙස් වලට අනුකූලව විශ්වවිද්‍යාලයෙන් අනුමත CCTV කැමරා ප්‍රතිපත්තියට අනුව අවශ්‍ය පරිදි අමතර CCTV කැමරා ස්ථානගත කෙරේ.
- ගමන් මළු සහ අනෙකුත් බඩුබාහිරාදිය සෑම විටම ළඟ තබා ගත යුතු වේ.
- ශිෂ්‍යයන් විශ්වවිද්‍යාලයෙන් පිටව යෑමේදී තමන්ට අයත් කිසිවක් විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ තබා යෑම සිදු නොකළ යුතුය.
- රථ වාහන (යතුරුපැදි ඇතුළුව) නවතාතැබීම වාහන නැවැත්වීමේ ප්‍රදේශ තුළ පමණක් සිදු කළ යුතු වේ.
- විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ යතුරු පැදි ඇතුළුව රථ වාහන නවතා තැබීමේදී අයිතිකරුවන් විසින් තම නම සහ දුරකථන අංකය පැහැදිලිව දර්ශනය වන සේ ලියාතැබිය යුතු වේ.
- විශ්වවිද්‍යාලයට පැමිණෙන සියළුම අමුත්තන් ජාතික හැඳුනුම්පත (NIC) පිවිසුම් දොරටු 1,3 සහ 4 වෙත ලබා දී අමුත්තන් සඳහා වන අවසර පත්‍රයක් (Visitor's pass) ලබාගත යුතු වේ. විශ්වවිද්‍යාල පරිශ්‍රයෙන් පිටවීමේදී අමුත්තන්ගේ අවසර පත්‍රය නැවත බාරදෙන විට ජාතික හැඳුනුම්පත නැවත ලබා දෙනු ලැබේ.

සෑම දෙනාගේම ආරක්ෂාව වෙනුවෙන් මෙම ආරක්ෂක ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා සියළුම ශිෂ්‍යයන්ගේ සහයෝගය ඉල්ලා සිටිමි.

මෙයට විශ්වාසී,

මහාචාර්ය.එස්.ඒ අරියදුරෛ

උපකුලපති

වැඩිදුර තොරතුරු සඳහා:

| | |
|---|---|
| ප්‍රධාන ආරක්ෂක නිලධාරී | +94 112 881 344 |
| උපදේශක | +94 112 881 361 |
| ප්‍රධාන ශිෂ්‍ය උපදේශක | +94 112 881 315 |
| විශ්වවිද්‍යාල දුරකථන අංක | +94 112 881 000 |